සැ. යු.- 2012.05.04 දින පළ වූ අංක 1,757 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,758 - 2012 මැයි 11 වැනි සිකුරාදා - 2012.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 382 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 18 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2012 මැයි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

ඩිරෙක්ටරීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ගණන් බේරා වසා දැමීමේ කාරණය සහ 2007 අංක 07 දරන සමාගම් පනත සම්බන්ධ කාරණය පිළිබඳවයි.

ඉල්ලුම්පත් අංකය : එච්. සී. (සිවිල්)/14/2012 (සීඔ).
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම.

ඩිරෙක්ටරීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලෙවල් 4, අංක 2, කාසල් පටුමග,
කොළඹ 04.

........................................................................පෙත්සම්කරු.

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 04, කාසල් පටුමග, අංක 2, ලෙවල් 4 දරන ස්ථානයේ පිහිටි ඩිරෙක්ටරීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් 2012 මාර්තු මස 28 වැනි දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2012 මැයි මස 31 දින අධිකරණය ඉදිරියේ විමසීම් සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධවීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අත්සන් කළේ :

එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥවරු,
216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

*සටහන.*- එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවිය යුතු ය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම්, සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළයුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළයුතු අතර 2012 මැයි මස 30 වැනි දින පස්වරු 6.00ට පෙර බාරදිය යුතු ය. නැතහොත්, තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතු ය.

05-181